www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඩිමොක්‍රැටික් පක්ෂයෙන් සින්ඩි ෂිහාන්ගේ ඉවත්වීම ගැන නේෂන් සඟරාව නිහඬව සිටින්නේ මන්ද?

## දෙවැනි කොටස

**Why the *Nation* remains silent on Cindy Sheehan's departure from the Democratic Party - Part 2**

**ඩේවිඩ් වොල්ෂ් විසිනි**
**2007 ජුනි 19**

*මෙය කොටස් තුනකින් යුත් ලිපියක දෙවැන්නයි.*

නේෂන්හි ප්‍රමුඛ ලේඛකයන් - කොන්ග්‍රසයේ ප්‍රගතිශීලී කන්ඩායම් රැස්වීමේ මැදහත්කරු ලෙස ජෝන් නිකොල්ස්, කර්තෘ කැට්රිනා වැන්ඩන් හියුවෙල්ගේ ම වචනවලින් "දක්ෂ, ඓතිහාසිකව නිපුන හා රාජ්‍යතාන්ත්‍රික" - පවතින දේශපාලන ව්‍යුහයන්ට බද්ධ වී සිටිති.

සඟරාව අවධාරනය කරන පරිදි "කිසිවෙකුත් නේෂන් අයිතිකරගෙන නැත. අප, අපගේ ම හෘදසාක්ෂ්‍යය විසින් මුලුමනින් ම අත්පත් කරගෙන තිබෙන උපාංගයකි." යනුවෙන් කියාපාන එහි දේශපාලන ස්වාධීනත්වය සාවද්‍යය. සතිපතා සඟරාව නියෝජනය කරන්නේ ඇමරිකානු සංස්ථාපිතයේ වාමාංශය යි.

එම මිනිසුන් පවත්නා පද්ධතියේ ආන්තික අතිරික්තයට විරෝධය දක්වූවත් එම විරුද්ධත්වයට අනුල්ලංඝනීය සීමාවන් තිබේ. අවසාන විග්‍රහයේ දී විශේෂිතව ඩිමොක්‍රැටිකයන් සමග ඇති නිමක් නැති බැඳීම්, යුද්ධයට සමාජ අසමානතාවයට හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එල්ල කෙරෙන ප්‍රහාරයන් කෙරෙහි ඇති විරෝධයට වඩා බොහෝ බලගතු ය.

යම් තරමක අවංකභාවයකින් 1995 දී හිටපු සංස්කාරක හා ප්‍රකාශකයා වූ වික්ට නවාස්කි සම්මුඛ සාකච්ඡාකරුවෙකුට පැවසුවේ නේෂන්හි "ඩිමොක්‍රටික් පක්ෂයේ මධ්‍යය හා නාඩර්වාදීන් අතර පරතරයක් ඇති බවයි.

වත්මන් සංස්කාරක හා ප්‍රකාශකයා වන වැන්ඩන් හියුවෙල් එක්සත් ජනපද ප්‍රභූවේ නිමැවුමකි. ඇගේ මවු පාර්ශ්වයේ සීයා වූ ජුලියස් ස්ටේන්, විනෝදකාමී ව්‍යාපාරික සංගතයක් වන එම්සීඒ හි මූලාරම්භකයා විය. ඇගේ පියා වූ විලියම් වැන්ඩන් හියුවෙල්, සීඅයිඒ සංවිධානය ගොඩනැගීමේ මූලික ක්‍රියා කලාපයක් ඉටු කල විලියම් ඩොනවන්ගේ විධායක සහකරුවෙක් ලෙස සේවය කලේ ය. ඩොනවන් තායිලන්තයේ තානාපති වූ පසු හියුවෙල් මානව හිතවාදී පදනමක් වූ ෆෙයාෆීල්ඩ් පදනමේ අධ්‍යක්ෂ මන්ඩල සාමාජිකයෙක් බවට පත් වූ අතර එය සීතල යුද්ධයේ අවධිය තුල විවිධ සංස්කෘතික කන්ඩායම් හා පුද්ගලයින්ට සීඅයිඒ හි රහසිගත අරමුදල් සපයන වාහනයක් ලෙස ක්‍රියාත්මක විය. පසුව ඔහු නිව් යෝර්ක් ආන්ඩුකාර අවරිල් හාරිමාන්ගේ හා පසුව එක්සත් ජනපද නීතිපති රොබට් කෙනඩිගේ විශේෂ උපදේශකයෙක් විය.

කැට්රිනා වැන්ඩන් හියුවෙල් ඇගේ පියා සම සභාපතිවරයෙක් වූ ෆ්‍රෑන්ක්ලින් හා එලිනෝර් රූස්වෙල්ට් ආයතනයේ (එෆ්ඊආර්අයි) පාලක මන්ඩල සාමාජිකාවකි. එම සමූහ ව්‍යාපාරයේ පාලක මන්ඩලයෙහි අනෙකුත් සාමාජිකයන් අතර මේරිලන්ඩ් හි හිටපු සෙනෙට් සභික පෝල් සාර්බේන්ස්, හිටපු ඩිමොක්‍රටික් පක්ෂ උප ජනාධිපති අපේක්ෂකයකු වූ ජෙරල්ඩීන් ෆෙරාරෝ හා තවත් සීඅයිඒ පුරුකක් වන ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වන ජාතික උරුමයේ අධ්‍යක්ෂවරයෙක් හා නිව් යෝර්ක් විශ්වවිද්‍යාලයේ හිටපු සභාපති ද වේ.

පුද්ගලයන් සිය හැදියාවට එරෙහිව කැරලිගසනවා හා නිශ්චිත පෙරලිකාරී නිගමනයන්ට එලඹෙනවා විය හැකිය. නේෂන්හි වැන්ඩන් හියුවෙල් එවන් කිසිදු අභ්‍යන්තර පෙරලියකට බඳුන්වී ඇති බවට ඇඟවීමක් නැත. ඇය ලිබරල් සංස්ථාපිතයේ රූපකායක් ලෙස සිටිනවා හා සිට ඇත.

මූල්‍ය හා දේශපාලන ප්‍රභූව වෙත මෙහෙයවෙන නේෂන්හි සම්බන්ධතාවන් බොහෝ ය. නිදසුන් කිහිපයක් චිත්‍රයක් ඇඳගැනීමට ප්‍රමානවත් ය.

සඟරාවේ ලාභ නොලබන සහකාර සංවිධානයක් වන නේෂන් ආයතනයේ සභාපතිත්වය හොබවන්නේ හැමිල්ටන් ෆිෂ් වී ය. අසාර්ථක කොන්ග්‍රස් අපේක්ෂකයෙක් වන ඔහු මේ තාක් ප්‍රකට හා සංස්ථිතික දේශපාලන පවුලකින් පැවත එන ලිබරල්වාදියෙකි. ෆිෂ්, 1999 දී නේෂන් ආයතනයට ඩොලර් 50,000ක ප්‍රදානයක් කල විවෘත සමාජයේ ආයතනයෙහි හිමිකරු වන ප්‍රකෝටිපති ජෝර්ජ් සොරෝස්ගේ දේශපාලන උපදේශකයෙකි. සොරෝස්ගේ ප්‍රකාශිත අරමුන වී

ඇත්තේ රිපබ්ලිකානු දක්ෂිනාංශය විසින් ක්‍රියාත්මක කරන දේශපාලන යටිතලයට සමාන්තරයක් නිර්මානය කිරීම යි. ඔහු මේ සඳහා ඩොලර් මිලියන සියගනනක් වියදම් කර තිබේ. බොහෝ වාම ලිබරල් සංවිධාන ඔහුගේ පරිත්‍යාගලාභීන් වී ඇත.

ක්ලින්ටන්ගේ හිටපු ධවල මන්දිර කාර්ය මන්ඩලයේ ප්‍රධානියා වූ ජෝන් පොඩෙස්ටා විසින් මෙහෙයවන බුද්ධි මන්ඩලයක් වන ප්‍රගතිය සඳහා වූ ඇමරිකානු කේන්ද්‍රය සීඒපී (කැප්) ගොඩනැගීමේ දී සොරෝස් තීරනාත්මක ක්‍රියා කලාපයක් ඉටු කලේ ය. කැප්හි ජ්‍යෙෂ්ට පුද්ගලයෙකු වන එරික් ඇල්ටමන් ඩිමොක්‍රැටිකයන්ගේ වඩාත්ම ඝෝෂා කාරී ආරක්ෂකයෙකු ද දැඩි කොමියුනිස්ට් විරෝධියෙකු ද වේ. විජිගීෂාවෙන් යුත් බොහෝ පුද්ගලයෝ එවන් ආයතන හා පදනම්වල හැලියෙන් සප්පායම් වෙති.

2006 මැතිවරනයෙන් පසුව ඩිමොක්‍රටික් පක්ෂය වොෂින්ටනයේ යලි හිස එසවීම, ලිබරල් ඩිමොක්‍රැටික් කන්ඩායම කැපිටල් හිල් යටි බිම්මහලෙන් රේබන් හවුස් කාර්යාල ගොඩනැගිල්ලට සැපත්වීම පිලිබඳව වැන්ඩන් හියුවෙල්ගේ සඳහන් කිරීමෙන් සංකේතවත් කරන දේ හි අර්ථය වනාහි ලිබරල් වම්මුන් සඳහා වඩාත් පුලුල් අවස්ථාවක් විවෘතව ඇති බවයි. ප්‍රධාන පක්ෂ දෙකෙහි වාසනාවේ පෙරලිය සමග වොෂින්ටනය නිර්ලෝභීව ගෙවීම් කරන ආන්ඩුවේ තනතුරු සියගනනක් පමනක් නොව දහස් ගනනක් හිමිකර ගැනීමේ හැකියාව ලැබේ. සාමාන්‍ය ආර්ථික වාතාවරනය ජය ගත් පක්ෂයේ ආධාරකරුවන්ට වැඩි වාසි සලසයි. ගරුකටයුතු වම්මුන් ඩිමොක්‍රැටිකයන්ගේ සරු හොද්දෙන් බෙදා ගැනීමට පසුබට වන්නේ කුමක් නිසා ද?

ජනගහනයේ මෙම ස්තරය දැනටමත් පොහොසත් වී ඇතුවාක් මෙන් ම ඇමරිකානු ඉහල මධ්‍යම පන්තියේ සැලකිය යුතු කොටසක් ද සමග පොදුවේ දකුනට හැරී ඇත. මෙයට නිදසුනක් ලෙස පෙර කිවූ ඇල්ටර්මන්ගේ පෞද්ගලිකත්වයේ හා ජීවන රටාවේ ඇතුල් පැත්ත පෙන්නුම් කරන ලිපියක් 2003 *නිව් යෝර්ක් ඔබ්ස'වර්* පත්‍රයෙන් ගෙන හැර දැක්විය හැකි ය.

ලිපිය ආරම්භ වූයේ, "නේෂන්හි ලේඛකයා මැන්හැටන්හි බටහිර 55වන වීදියේ මාධ්‍යකරුවන් ගැවසෙන ස්ථානයක් වන මයිකල්ගේ අවන්හලෙහි රැඳී සිටියේ ය. හතලිස් තුන් හැවිරිදි ඇල්ටර්මන් මහතා ලග සාර්ථකත්වයේ දුගඳ හමයි. ඇමරිකාව වෙනුවෙන් කථාකරන්නේ කවුරුන්ද වැනි නොහික්මුනු මාතෘකා සහිත ග්‍රන්ථ හතරක් ඔහු සතු ය. නේෂන් සඟරාවේ තීරු රචක මාධ්‍යකරුවෙකි. ඔහුගේ සිතෙහි ඇති කුමන හෝ බහුබූතයක් ලියන MSNBC.com (එම්එස්එන්බීසීඩොට්කොම්) මගින් පඩි ලබන වෙබ් අඩවි පාලුවෙකි. [ මිල්ටර්මන් එම්එස්එන්බීසියෙන් 2006 දී ඉවත් විය. වැන්ඩන් හියුවෙල් "දැඩි පන්දුවකින් ක්‍රිස් මැතිව්ස් සමඟ" යන කේබල් නාලිකාවේ නිතර පෙනී සිටියි.] කෝනෙල්, යේල් හා ස්ටැන්ෆර්ඩ් විශ්වවිද්‍යාල උපාධිධාරියෙකි. ඔහුගේ මංගල්‍යයේ සහකරුවා ජෝර්ජ් ස්ටෙෆනෝ පවුලොස් [බිල් ක්ලින්ටන්ගේ හිටපු සංනිවේදන අධ්‍යක්ෂ හා දැන් ABC (ඒබීසී) මාධ්‍යයේ ප්‍රධාන වොෂින්ටන් වාර්තාකරුය.] ය.

ඇල්ටර්මන් "කංසා, කෝබි හරක්මස් හා පිනොට් නොයර් වීදුරුවක් ඇනවුම් කලේ ය. කලින් ඔහු කියා ඇත්තේ තමන් මිල අධික දහවල් ආහාරයකට කැමති බවයි. එදින සවස වීක් සඟරාවේ ප්‍රකාශක ජස්ටින් ස්මිත් ඔහු වෙනුවෙන් රාත්‍රී භෝජන සංග්‍රහයක් පැවැත්වී ය. එයට නිව් යෝර්ක් නගරයේ නගරාධිපති තනතුරට තරග කල මාක් ග්‍රීන්, ලේඛක කැල්වින් ට්‍රිලින්, නේෂන්හි වික්ටර් නවාස්කි හිටපු හා නිරූපිකාවන් තිදෙනෙක් පවා සහභාගී වනු ඇත. [මයිකල්ස් ආපනශාලාවේ වත්මන් වාර්තාගත කෑම වට්ටෝරුවට අනුව හැම්බර්ගර් එකක් සඳහා අමතර ඩොලර් 33ක් අය කෙරේ.]

ස්වයං තෘප්තියේ හා ආත්මාර්ථකාමයේ පිලිරුව සිත්ගන්නාසුලු නොවේ. එහෙත් මෙම කුඩා ලෝක සමාජයේ පුලුල් ස්තරයන්, දීම හෝ ගැනීම දෙසට පුලුල් කල හැකිය. ඊට වඩා අඩු හෝ වැඩි ඇල්ටර්මන්ලා බොහොමයක් මැන්හැටන්හි ඉහල බටහිර කොටසෙහි, නිව්යෝර්ක්හි අනෙකුත් කොටස්වල හා ඒ සමානම සංඛ්‍යාවක් චිකාගෝ බොස්ටන්, මුහුදු බොක්ක ප්‍රදේශයේ, ලොස් ඇන්ජලීස්, සියැටල් හා වෙනත් තැන්වල සිටිති.

මෙවැන්නන් මාධ්‍ය තුල, උගතුන් අතර (**ඇල්ටර්මන් නව පාසැලේ හි ඇමරිකාවේ හා ලෝක ප්‍රතිපත්ති ආයතනයේ ජ්‍යෙෂ්ට පුද්ගලයෙකු ද වේ**) බුද්ධිමන්ඩලතුල හා වෘත්තීය සමිතිවල හොඳ හිලව් ගෙවීම් ලබමින් හා හොඳින් පැලපදියම් ව සිටිති. ඔවුන් හොඳ සම්බන්ධතාවන් ඇතිව සුරක්ෂිතව දොරටුවෙහි සිටිති. මෙම සමාජ කවයන් තමන් සඳහා හොඳින්ම සැලකුම් ලබාගනිති. පාලක පැලැන්තියට වැටුප් හා සහනාධාර කැපීම සඳහා ලැබී ඇති හැකියාව මත පාර්ශ්වීය ලෙස පදනම්ව, කොටස් වෙලඳපොලෙහි ඉහල නැගීමෙන් මෙන් ම බුෂ්ගේ බදු කපා හැරීමෙන් ද, ඔවුහු වාසි ලබති. කම්කරු පන්ති විරෝධී මෙම ප්‍රතිපත්ති කෙරෙහි ඔවුන්ගේ ම විරෝධය මෙමගින් කැපීපෙනෙන පරිදි සෝදාපාලු වී ඇත. "ලදරු උපත් ඉහල නැගී" පරම්පරාවේ අය මියයාම හා ඔවුන්ගේ වත්කම් විකුනාදැමීම සිදුවන විට ඩොලර් ට්‍රිලියන ගනනක් වූ ධනය අන්තර් පරම්පරාවන් අතර ඉමහත් ලෙස හුවමාරු වෙමින් තිබේ.

*නිව් යෝකර්* සඟරාවේ චිත්‍රපට විචාරකයෙකු වන ඩේවිඩ් ඩෙන්බි "රැවටුනු ඇමරිකානුවා" නම් සිය කෘතියෙහි තමාගේ ම මැදිවියෙහි අර්බුදය හා

කොටස්වෙලඳපොල තුලට විනාශකාරී ලෙස කඩා වැදීම ගැන කතා කරයි. තම සමාජ වටපිටාව කෙරෙහි 1990 ගනන්වල වෙලඳපොල, දේපල හා ලාභ පිම්බීමේ ආනිසංස ගැන ඔහු සඳහන් කරයි.

"සිදු වූයේ හුදෙක් මූල්‍යමය වෙනසක් නොවේ. එය සංස්කෘතික එකකි. මා වැනි ලිබරලුන් මවිතයෙන් මෙන් බලා සිටියේ ධනවාදය කෙරහි වූ ඔවුන්ගේ පාර්ශ්වීය නොකැමැත්ත පහව යන හා එය අකැමැත්තෙන් මෙන් ඉවසා සිටීමෙන් පසුව මුලුමනින්ම අගය කරන තැනකට පත්වන ආකාරයන් ය. ධනවාදය ජෝසෆ් ෂුම්පිටර්ගේ සුප්‍රකට වැකියක එන "නිර්මානාත්මක විනාශකාරීත්වය" බවට පත් වූයේ නම් සංගතයන්ගේ පාලන යුගයේ දී ව්‍යසනය සිනමාවේ ප්‍රමුඛ තැනකට පත්ව තිබේ. තවමත් සිහිබුද්ධිය ඇති ඕනෑම අයෙකු දැන් අවබෝධ කරගනු ඇත්තේ අපගේ ආර්ථික පද්ධතිය වෙනත් එවැන්නකට වඩා බෙහෙවින් හොඳ බවයි. නිසැකව ම එය අපගෙන් සමහරෙක් ඉසුරුමත් කරයි."

දහස් ගනනක් වන හිටපු ලිබරලුන් හා රැඩිකලුන් වෙනුවෙන් ඩෙන්බි අව්‍යාජ ලෙස කතා කරයි. එහි සියලු සීමාසහිතකම් තිබියදී ම ජනගහනයේ මෙම ස්තරය, එක් අවධියකදී ධනය හා මුදල් රැස්කිරීම කෙරෙහි දුරුවේ සතුරු ආකල්පයකි. "ව්‍යාපාර" හා " ලාභ" මෙන්ම "සමපේක්ෂනය" ද ඔවුන්ට නරක වචන විය. ධනවතුන් නොවූ ඔවුන්ට කම්කරු පන්තිය සමග සම්බන්ධතාවන් පවා තිබුනි.

දැන් කම්කරු පන්තික පවුල් කායිකව ම ඉවතට තල්ලු කරමින් මැන්හැටන් හා අනෙකුත් ප්‍රදේශ ධනේශ්වරය අතට පත්වත්දී ද, මෙම තෘප්තිමත් ලිබරලුන්ගේ ආදායම් ඉහල නගිද්දී ද, "කම්කරු ව්‍යාපාරය" ට ඔවුන්ගේ පැවති එකම බැඳීම වෘත්තීය සමිති නිලධරය වූ අතර ඔවුන් ද සමිති සාමාජිකයන්ගෙන් හා අනෙකුත් කම්කරුවන්ගෙන් බිඳී යමින් ධනවතුන් වීමේ ඒ සමානවූ සමාජ ක්‍රියාවලියකට හසුව තිබේ.

## ඒඑෆ්එල්-සීඅයිඕ වෘත්තීය සමිති සම්මේලනය සමග සම්බන්ධකම්

නේෂන්හි නිතිපතා ලිපි පලකරන ඩේවිඩ් සිරෝටා මෙම භූයපට ගනනාවක් එකට කැටිකරයි. කොන්ග්‍රසයේ හිමිකම් කමිටුවෙහි ඩිමොක්‍රැටිකයන්ගේ හිටපු කථිකයා වූ ද, වර්මොන්ට්හි කොන්ග්‍රස් සභික බර්නි සැන්ඩර්ස්ගේ හිටපු මාධ්‍ය ලේකම් වූ ද, ඇමරිකානු ප්‍රගතිය සඳහා මධ්‍යස්ථානයේ හිටපු සාමාජිකයෙකු වූ ද, "ඩිමොක්‍රැටික ප්‍රචාරන කාර්යධරයෙකු" ලෙස තෙමේම හඳුන්වාගත් සිරෝටා, ප්‍රගතිශීලී ප්‍රාන්ත ජාලයෙහි පුරෝගාමී සම සභාපතිවරයෙකු ද වේ. 2005 දී පසුව කී ආයතනය පිහිටුවනු ලැබුවේ, සමිති නිලධරයේ න්‍යායපත්‍රය වෙනුවෙන් ප්‍රාන්ත ව්‍යවස්ථාදායකය පෙලඹවීම සඳහා, ජෝර්ජ් සොරෝස්ගේ විවෘත සමාජ ආයතනය, පොඩෙස්ටාස් කැප්, ඒඑෆ්එල්-සීඅයිඕ, සේවා අංශ සේවකයන්ගේ ජාත්‍යන්තර සංගමය, ඒඑෆ්එස්සීඑම්ඊ හා එක්සත් වානේ කම්කරුවන්ගේ සමිතිය විසිනි.

වෘත්තිය සමිති නිලධාරි තන්ත්‍රය සමග බැඳීම් පැවති තවත් පුද්ගලයෙකු වූයේ නේෂන් හි ලේඛක හා සංස්කාරකවරයෙකු වූ මාර්ක් කූපර් ය. වොෂින්ටන් ඩීසී හි සංස්කාරක ඩේවිඩ් කෝන් මෙන්ම සඟරාවේ ප්‍රමුඛ නොමග යවන්නෙක් වන කූපර්, (බලන්න " අධිරාජ්‍යවාදයේ 'වාම' ක්ෂමාලාපකයන් යුද විරෝධී ව්‍යාපාරය නොමග යවයි") වෘත්තීය සමිති ප්‍රේක්ෂකයන් හමුවේ කතා කල ජනාධිපති අපේක්ෂකත්වය බලාපොරොත්තුවන විවිධ ඩිමොක්‍රටිකයන් පිලිබඳ ප්‍රචාරක ලිපි මැතක දී ලියා ඇත.

මාර්තු මාසයේ දී, ලාස් වේගාස්හි සමිති ගත හෝටල් කම්කරුවන් දහස් ගනනක් හමුවේ පෙනී සිටි හිලරි ක්ලින්ටන්, බැරැක් ඔබාමා හා බිල් රිචඩ්සන් පිම්බීම සඳහා කූපර් සිය වැර යෙදී ය. නේෂන්හි පලකල "ක්ලින්ටන් හා ඔබාමා සමිතිවලට කතා කරයි" යන ලිපිය තුල කූපර් ඔවුන්ගේ දේශන වර්නනා කලේ ය.

ඔහුගේ වඩාත්ම ගැත්තර ප්‍රකාශන සිය පෞද්ගලික වෙබ් අඩවිය සඳහා ඔහු සුරැකිව තබාගත්තේ ය. නිදසුනක් ලෙස "ඔබාමා ලාස් වේගාස් රැලියේ වේදිකාව මත දී මුදල් ගැරීමේ ආශාවේ මුල් උදුරා දැමීය. බල්ලෙකු නොමැති මෙම තරගයේ දී, ඔහු එය රථගාල තුල අතහැර දැමීය යි මා කිවයුතු ය. සැබැවින්ම ස්වාභාවික වන මේ පුද්ගලයා වේදිකාව මත ඇඳහිය නොහැකි තරම් පහසුවෙන් සිටි අතර ඔහු ප්‍රභාව වගුරවයි. දැන් ඔහු සමීපව දැකගැනීමෙන් පසුව ඔහු ක්ලින්ටන් මහතාටත් වඩා (ඔහු ද අතිශයින්ම හොඳය) හොඳ බව මට කිව හැකිය. ඔබාමා සිය මුලු කතාවම කැප කලේ වෘත්තීය සමිතිවල බලය හුවා දැක්වීමට ය."

බරාක් ඔබාමා හෝ බිල් ක්ලින්ටන් වැනි අයෙක් පිලිබඳව වැදගැම්මකට නැති අභිරුචියක් පලකිරීමට කූපර් හා අනෙක් අය යොමු කල හැකි වූයේ කුමන ඓශ්වර්යකට ද? දේශපාලඥයන්ගේ වචනවල කිසිදු අවංකභාවයක් හෝ බැරෑරුම් අන්තර්ගතයක් නොමැති තත්වය තුල එවන් අර්ථවත් සිහිකැඳවීමකට හේතුව ඔවුන්ගේ බලය හෝ සාර්ථකත්වය නැතිනම් උපාමාරු දැමීමේ හැකියාව විය යුතු ය.

ඒඑෆ්එල්-සීඅයිඕව විසින් සියැටල් නගර සභා ශාලාවේ සංවිධානය කල රැස්වීමක ජෝන් එඩ්වර්ඩ්ස් විසින් කල රංගනයක්, එවැනිම උද්යෝගිමත් හඬකින්, මැයි මාසයේ නේෂන්හි පලවූ "එඩ්වඩ්ස්ට කඩේ යෑම" නම් ලිපියක් තුල කූපර් විස්තර කරයි. "බෙහෙවින් කුල්මත්ව සිටි වෘත්තීය සමිතිවාදීන් 800ක් දෙනා" පස්

වතාවක් නැගිට සිටිමින් එඩ්වර්ඩ්ස්ට ආචාර කල බවත් උතුරු කැරොලිනාහි හිටපු සෙනෙට්සභිකයා "පසුගිය දෙවසර තුල නිහඬව සිටියේ වී නමුත්, කම්කරු අපේක්ෂකයා වීම සඳහා ඉතා සූක්ෂම ලෙස පසුබිම සකස්කරමින් සිටි අතර එම රේල් පීල්ල මත කෙලින්ම අපේක්ෂකත්වය කරා ධාවනය කිරීමටත් බලාපොරොත්තුවන බව" කුපර් සඳහන් කරයි. "ඔහු පිකට් උද්ඝෝෂනවල සැරිසරමින් එවැනි දේ සංවිධානය කිරීමට සහයෝගය දෙමින් වෘත්තීය සමිති ප්‍රශ්න පිලිබඳව කතාකර තිබේ."

මේ සියල්ල මුලුමනින්ම අනුමාන කල හැකි හා කලින් ලියා තැබිය හැකි දේ ය. හොඳාකාරව ම සිදු විය හැකි පරිදි එඩ්වඩ්ස්ගේ නම ඉවත් කල හැකි අතර අවස්ථාවාදී හේතු නිසා "ජනතාවාදී" තුරුම්පුව ගැසීමට වෙනත් ධනවත් ඩිමොක්‍රටික් පක්ෂ දේශපාලඥයෙකු නම් කරමින් එම අඩුව පිරවිය හැකි ය. එහෙත් කිසිවක් වෙනස් නොවනු ඇත. නිසැකව ම ජනගහනයේ පුලුල් ස්තරයකගේ තත්වයෙහි වෙනසක් නොවනු ඇත.

කුපර්, නිකොල්ස්, වැන්ඩන් හියුවෙල් හා අනෙක් අය තමන් සමග මෙන්ම තම පාඨකයන් සමග ද අවංක නොවෙති. මක්නිසා ද යත් හොඳින් මුල් බැසගත් බුද්ධි මන්ඩල, විශ්වවිද්‍යාල, මාධ්‍ය ආයතන, වෘත්තීය සමිති හා උපදේශක ආයතනවල මාධ්‍ය නියෝජිතයන් ලෙස ඔවුන් ඉටු කරන ක්‍රියා කලාපය, ඇමරිකාවේ සමාජ සම්බන්ධතාවන් සමග සෘජුව හා වෛෂයිකව ගනු දෙනු කිරීමෙන් ඔවුන් වලක්වන නිසා ය. ඔවුන්ට දේවල් නියම නාමයෙන් හැඳින්විය නොහැක.

හොඳින් පැලපදියම් වූ මෙම මධ්‍යම පන්තිය වර්තමාන රාජ්‍යතාන්ත්‍රිකය පිලිබඳව නොසතුටෙන් පසුවන නමුදු, ඇමරිකානු සමාජයේ ගැඹුරු වෙනසකට බලපාන යමක් ඔවුන් සන්තකයේ පැවතුනා නම් ඒ පිලිබඳ බලාපොරොත්තු හා උනන්දුව දිගු කලකට පෙර ම පහව ගොස් ඇති මෙම පුද්ගලයන් දේශපාලන ක්‍රියාවලිය මත බලපෑම් යොදන්නේ අවසාන වශයෙන් තමන්ගේ ම හා තමන් වටා සිටින අයගේ ජීවිතය වඩා සුවපහසු කිරීම සඳහා ය.

සමහර කාරනාවල දී ඔවුන් පෙරලිකාරී තරුනයන්ගේ සිට ඊට බෙහෙවින් වෙනස් දෙයක් බවට පරිවර්තනය වී තිබේ. ඔවුන්ගේ "පැරනි මමත්වය" " නව මමත්වය" මගින් කම්පනයට පත් කොට තිබේ. ඔවුන් අතර ශේෂ වී තිබේ යැයි හැඟෙන කුමන හෝ විරුද්ධත්වයක් හා පෙරලිකාරිත්වයක් වෙනත් කිසිවකටත් වඩා ගැඹුරෙන් සංවේදනය වන ඔවුන්ගේ සමාජ සම්බන්ධතාවන් හා බැඳීම් මගින් කිහිප ගුනයකින් යටපත් කර දමයි.

කෙසේ වුවද, නව වාම යුගයේ දී පෙරලිකාරී වූ තරුනයන් ලෙස පවා, මෙම සමාජ ස්තරයේ සාමාජිකයන්, න්‍යායිකව ගැඹුරකින් තොර. බුද්ධි විරෝධයෙන් සතුටට පත් හා නග්න දේශපාලන මගක් අනුගමනය කිරීමේ පිපාසාවෙන් පෙලෙති. දන් ඔවුන්ගේ ව්‍යායාමය තුල ගැබ් කරගන්නේ <u>යථා දේශපාලන</u> නරුමත්වයේ පුලුල් මූලාශ්‍රයන් ය. අසංතෘප්තියේ විවිධ පරිමාවන්ගෙන් ඔවුන්ම ඇබ්බැහි වී සිටින්නේ වඩවඩාත් මන්දබුද්ධික ක්‍රියාවන් හා පුද්ගලයන් ලෙස යුක්ති සහගත වී ගැනීමේ ය.

ෂිහාන්ගේ පරිනාමය පිලිබඳව ඔවුන් නොඇසූකන්ව සිටීමෙන් ඇඟවුම් කරන්නේ වාම ඩිමොක්‍රටිකයන්ට එරෙහිව ජනතා වාම ව්‍යාපාරයක් මතුවී ඒම කෙරෙහි නේෂන්හි ලේඛකයන් ඔවුන් වඩාත් සංවේදී හා සතුරුව සිටින බවයි. එවන් තත්වයක් හමුවේ ඔවුන් කුමන ක්‍රියා කලාපයක් ඉටු කරනු ඇත් ද? ඩේවිඩ් කෝර්න් දනටමත් මාවතක් පෙන්වා තිබේ. 2002 නොවැම්බරයේ ෆොක්ස් නිව්ස් නාලිකාවේ දී ඔහු ඇඟිල්ල දිගු කර ඇත්තේ "දැඩි මතධාරී කොමියුනිස්ට් සංවිධානයක්" ලෙස නම් කල දක්ෂිනාංශික හා අනුග්‍රාහක බිල් ඕ රෙයිලි වෙත ය. ඔහු යුද විරෝධී උද්ඝෝෂන සංවිධානය කිරීමේ දී ප්‍රමුඛ ක්‍රියා කලාපයක් ඉටු කල බවට චෝදනාවක් ද සමග ය. නේෂන් හි ලේඛකයන් සුපරීක්ෂාකාරීව සිටිති. බලයේ පවතින කුමකට හෝ විරෝධය පාන කුමන හෝ බැරෑරුම් වාමාංශික ව්‍යාපාරයක් ඔවුන් හඳුනාගනු ඇත.

**මතු සම්බන්ධයි**

© www.wsws.org